# මානව පරිණාමයේ ක්‍රමික විකාශනය පිළිබඳ අධ්‍යයනයක් (අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින්)

පූජ්‍ය. ඕපනායක සුසීම හිමි*

---

අද අප ප්‍රවිශ්ට වී සිටින්නේ ජීවී - අජීවී වටපිටාව පිළිබඳ විද්වතුන් බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වී ඇති යුගයට ය. විශේෂයෙන් ම විද්‍යාත්මක වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍රයන් වත්මන් සමාජය තුළ කරළියට පැමිණ ඇත. මානව විද්‍යාව මඟින් මේ වන විට මානවයාගේ පරිණාමය පිළිබඳ පරීක්ෂණ රාශියක් සිදු කොට හමාරය. එම සෑම පර්යේෂණයකින් ම ස්ථිර සාර නිගමනයක් සොයා ගෙන නැති අතර ඔවුන් කරුණු කිහිපයක් සනාථ කර ගෙන ඇත. ඒ අතරින් මානව පරිණාමය ගත් කල්හි එය වසර මිලියන ගණනාවක් දක්වා ඈතට දිව යන ක්‍රියාවලියක් බව විද්‍යමාන කොට ඇත. එකී කාල පරාසය මත සිට නූතන මානව විද්‍යාව මඟින් විවිධ අවධීන් වෙන් කර දක්වා ඇත. ඒ ඔස්ට්‍රලොපිතකස්, ඇෆරුන්සීස්, ඇනමෙනසීස්, ආදි වශයෙනි. විශ්වයේ හා මානවයාගේ පරිණාමය පිළිබඳව මෑත යුගයන්හි විද්‍යාත්මක පරීක්ෂණ සිදු කිරීමට පෙර සංපරීක්ෂණ සිදු කර ඇත. මීට වසර දහස් ගණනකට පෙර විවිධ ආගමික ශාස්තෘවරුන් විසින් විශ්වාරම්භය, ජීවාරම්භය පිළිබඳව තම ආගමික මත ප්‍රකාශ කර ඇත. එහිදී ඇතැමුන් නිර්මාණවාදයක් වශයෙන් ද, ඇතැමුන් අහේතුකව සිදු වී ඇති බවක් ප්‍රකාශ කරයි. බුදුරජාණන් වහන්සේ විශ්වයේ සහ ජීවයේ ආරම්භය පිළිබඳව පරිණාමාත්මක දේශනා ඉදිරිපත් කර ඇත. ඒ මීට වසර දෙදහස් පන්සියයකට පෙර උන් වහන්සේ සිදු කළ සාර්ථක අධ්‍යයනයකින් පසුව ය. විශ්වයේ සහ ජීවයේ පරිණාමය පිළිබඳව සඳහන් වන්නේ අග්ගඤ්ඤ සූත්‍රයේ ය. මානව පරිණාමවාදය පිළිබඳව නූතන අදහස් මතු වන්නට පෙර එම සූත්‍රයෙන් ඒ ආශ්‍රිත සියල්ල උගන්වා ඇත. අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් දක්වා ඇති මානව පරිණාමය පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් අග්ගඤ්ඤ සූත්‍රයත් ඒ ආශ්‍රිතව රචනා වූ ද්විතියික මූලාශ්‍රයයන් භාවිත කෙරේ. ජීව සම්භවය සම්බන්ධ පර්යේෂණ පැවැත්වූ විද්‍යාඥයින් පත්ව සිටින උභතෝකෝටික ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති අග්ගඤ්ඤ සූත්‍රය ඉතා වැදගත් වේ.

ප්‍රමුඛ පද : අග්ගඤ්ඤ සූත්‍රය, මානව පරිණාමය, මානව විද්‍යාව, බුදුරජාණන් වහන්සේ

---

* කැලණිය විශ්වවිද්‍යාලය suseemathero90@gmail.com